# පෙරවදන සහ හැඳින්වීම



**පෙරවදන** **11**

**හැඳින්වීම** 13

මාර්ටිනා ෆිෂර්, නෝබට් රෝපස්

© 2006 Berghof Research Center for Constructive Conflict Management

© 2006 Berghof Research Center for Constructive Conflict Management

# පෙරවදන

විවිධාකාර ස්වරූපයන් ගත් අර්බුද රැසකට මුහුණ දුන් අන්තර්ජාතික ප්‍රජාව ඒ සඳහා මානුෂික සහාය, සංවර්ධන ආධාර, අර්බුද වළක්වාලීම සහ අර්බුද නිරාකරණ වැඩසටහන් මාර්ගයෙන් මේ සඳහා ප්‍රතිචාර දැක්වීමට උත්සාහ දරා ඇත. මෙම විවිධ ක්‍රියාමාර්ග මගින් ස්ථාවර සංවර්ධනයකට සහ සාමයකට ඇති අවස්ථා වර්ධනය කරනු මෙන්ම, අර්බුදයේ විවිධ ගතික තීරණය කිරීමට ද උත්සුක වී ඇත. නියමාකාරයෙන් සිදුවන්නේ කුමක් දැයි අවබෝධ කරගැනීම සඳහා උගත් පාඩම් මොනවා ද සහ වඩාත් යහපත් ක්‍රියාමාර්ග කවරේ ද යන කරුණු තෝරා ගැනීම සඳහා ඒවාට අදාල තොරතුරු, පෞද්ගලික ව්‍යාපෘති හෝ වැඩසටහන් තක්සේරු කිරීම් මාර්ගයෙන් එක්රැස් කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් මෙතෙක් කෙරී ඇති අධ්‍යයන සංඛ්‍යාත්මකව වැඩි වී ඇතත්, විෂය ක්ෂේත්‍රය හෝ භාවිත කරන්නන් සඳහා වඩාත් පුළුල් සාකච්ඡාවක් ඇති කරනු වස්, ක්‍රමවත්ව හෝ එකළස් කොට සකස් වී ඇති පාඩම් ස්වල්පයකි.

සාධනීය අර්බුද කළමනාකරණය සඳහා වූ බර්ගොෆ් පර්යේෂණ මධ්‍යස්ථානය මෙම අත්පොත සකස් කළේ මේ වන විටත් ප්‍රචණ්ඩකාරී අර්බුද තුළ හා ඒවා ගැන කටයුතු කරන පුද්ගලයින්ට මුහුණ දෙන්නට සිදුවන විවිධාකාර වූ අභියෝගයන්ට ප්‍රතිචාර වශයෙනි. විවිධ දෘෂ්ටිකෝණ තුළින් අර්බුද ව්‍යාවර්තන ක්ෂේත්‍රයේ මෑතක දී ඇතිවී ඇති සංවර්ධන පිළිබඳ පැහැදිලි කිරීමක් ලබාදීම මෙහි අරමුණයිඃ ශාස්ත්‍රීය විශ්ලේෂකයන් සහ ඒවා භාවිත කරන්නන් මෙන්ම අර්බුද කලාපවල හෝ ඉන් පිටත සිට විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් කටයුතු කරන විශේෂඥයින්ගේ දෘෂ්ටිකෝණ මෙයට ඇතුළත් වේ.



මෙම අත්පොත පිළියෙල වී ඇත්තේ අදියර කිහිපයකිනි. පළමුව, බර්ගොෆ් ආයතනයේ ඇති වෙබ් අඩවියක (www.berghof-handbook.net) පළවූ ලිපි සංග්‍රහයක් වශයෙන් මෙය නිකුත් කෙරිණි. මෙම වෙබ් අඩවිය පෙළගස්වා ඇත්තේ ඉලක්කගත ලිපිවල අඩංගු කරුණු පිළිබඳ විවාදයක් ඇති කිරීමේ අරමුණින්, ඒවා භාවිත කරන්නන්ගෙන් ලැබෙන ප්‍රතිචාර සඳහා වේදිකාවක් වශයෙනි. මෙම ප්‍රතිපෝෂණ, ප්‍රතිචාර, අතිරේක ලිපි සහ මෙම යෙදවුම් මගින්, අර්බුද ව්‍යාවර්තන ක්ෂේත්‍රය තුළ ඇති වී ඇති සංවර්ධනය පෙන්නුම් කරන අවස්ථාවේ දී අත්පොත් සහ වෙනත් ප්‍රකාශන එළිදැක්වීමට ඉඩකඩ සැලසිණි. දෙවනුව බොහෝ ශාස්ත්‍රඥයින් සහ ක්‍රියාකාරීන් මෙවැනි ලිපිවල සම්පූර්ණ එකතුවක් නිතර ඉල්ලා සිටි බැවින් මෙම මුද්‍රිත ප්‍රකාශනය නිකුත් කිරීමට අදහස් කෙරිණි.

අපේ වෑයමට, මෙම අත්පොතට ලිපි සපයන්නට අප ඇරයුම් කළ අපේ සගයින්ගෙන්-ලෝකය පුරා විසිරී සිටින ශාස්ත්‍රධරයින්ගෙන් ලද ඉතා යහපත් ප්‍රතිචාරයට අපි කෘතඥ වන්නෙමු. ඉතා පළපුරුදු ක්‍රියාකාරීන් සහ විදග්ධයින් වන ඔවුන්ගෙන් ඇතැමෙක් අර්බුද නිරාකරණයට අදාළ ක්ෂේත්‍රවල නියමුවෝ වෙති. මෙම අත්පොතේ පොදු ප්‍රමිතීන් සඳහා තමන්ගේ ශෛලිය වෙනස්කර ගැනීමේ භාරදූර වගකීම ඔවුහු භාරගත්හ. ඔවුන්ගේ දැනුම, කැපවීම සහ නම්‍යශීලීභාවය නොවන්නට මෙම අත්පොත් ව්‍යාපෘතිය සාර්ථක නොවන්නට තිබිණි. මෙම බර්ගොෆ් අත්පොතේ අන්තර්ජාල හා මුද්‍රිත ප්‍රකාශන සඳහා දායකත්වය ලබාදුන් සියලුම කර්තෘවරුන්ට අපේ ස්තුතිය පුද කරමු. අපේ පාඨකයන් සහ ඉහත දැක්වූ පිරිස සමග අප ක්ෂේත්‍රයේ න්‍යාය හා භාවිතය සම්බන්ධ සියුම් කතිකාවක් ස්ථාපිත කිරීම සඳහා අවස්ථාව නිරතුරුව ලැබේවා යැයි අපි නිතරම ප්‍රාර්ථනා කරමු.

© 2006 Berghof Research Center for Constructive Conflict Management

2003 වසරේ මැද භාගය දක්වා වෙබ් අඩවියේ ගැබ්ව තිබූ ලිපි ලේඛන එක්රැස් කිරීමෙන් ලබාගත් තොරතුරු මෙම ප්‍රකාශනයෙන් නියෝජනය වෙයි. මෙම මුද්‍රිත ප්‍රකාශනය මේ ව්‍යාපෘතියේ අවසාන ඵලය නොවන අතර බර්ගොෆ් අත්පොත් ව්‍යාපෘතිය තව දුරටත් ඉදිරියට ගෙන යෑමට බර්ගොෆ් කණ්ඩායම වෙර දරන නිසා මෙය 'අතුරු වාර්තාවක්' ලෙස සැලකිය යුතුය. ඉදිරි සංවර්ධන කටයුතුවලදී පහත සඳහන් කාරණා ද එයට ඇතුළත් වේ.

1. අතීතයේ ඉලක්ක කර ගැනුණු තේමා සහ ගැටලු යථාර්ථයක් කර ගැනීම.
2. විශේෂ උනන්දුවක් හා වැදගත්කමක් ඇතැයි සැලකෙන ක්ෂේත්‍රවල පවතින ගැටලු සම්බන්ධයෙන් විවාද සහ සාකච්ඡා පැවැත්වීම.
3. වෙබ් අඩවිය ප්‍රතිසංවිධාන ව්‍යාපෘතියේ කොටසක් ලෙස සේවා සැපයීම සහ ප්‍රතිපෝෂණ මාධ්‍යයක් ලෙස භාවිත කිරීම.

වාර්ගික දේශපාලනමය අර්බුද පිළිබඳ ක්ෂේත්‍රයෙහි සාම භාවිතාව හා විශ්ලේෂණය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන මිත්‍රයන් සහ සගයින්ට අපගේ වෙබ් අඩවියේ 'What's new' යන්න යටතේ පරීක්ෂා කර එහි ඇති නිර්මාණශීලී ලිපි ලේඛන පරිශීලනය මෙයින් අදහස් කෙරේ.

අනාගතයේ දී විවිධ වාද විවාද සහ සාකච්ඡා පැවැත්වීම මෙම 'ඉදිරි ව්‍යාපෘති' යටතේ සිදු කරනු ලැබේ. මෙම ප්‍රකාශනයේ පළමු කාණ්ඩයෙන් ආරම්භ කළ සාමය සහ අර්බුදවල බලපෑම් තක්සේරුවක් යන මැයෙන් පැවති විවාදයට ඒවා සමාන වනු ඇත. මෙම විවාදය දැනටමත් මුද්‍රිත ප්‍රකාශයක් ලෙස බර්ගොෆ් මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කර ඇත (ඇලෙක්ස් ඔස්ටින්, මාර්ටිනා ෆිෂර්, ඔලිවර් විලිස් (සංස්.)ඃ සාමය සහ අර්බුද බලපෑම් තක්සේරුව, න්‍යාය සහ භාවිතාව පිළිබඳ විචාරාත්මක මත, බර්ගොෆ් සාකච්ඡා අත්පොත් මාලාව, සංවර්ධනාත්මක අර්බුද කළමනාකරණයක් සඳහා වූ බර්ගොෆ් පර්යේෂණ මධ්‍යස්ථානය, බර්ලින් 2003 බලන්න). මේ නිසා මේ වෙළුමට ඇතුළත් කර ඇත්තේ මාක් හොෆ්මාන්ගේ පළමු දායකත්වය පමණි.

මෙම බර්ගොෆ් අත්පොත කරළියට ගෙන ඒමෙහිලා විවිධාකාර අයුරින් උදව් කළ ආයතන, සංවිධාන සහ මූල්‍යමය ආධාර ලබාදුන් සියලු හිතවතුන්ට ස්තුතිය පිරිනැමේ. විශේෂයෙන්ම අර්බුද පර්යේෂණය සඳහා වූ බර්ගොෆ් පදනම *(Berghof Stiftung für Konfliktforschung)* සහ ජර්මන් පෙඩරල් රජයේ අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යාංශය *(Bundesministerium für Bildung und Forschung).* ඊට අයත් වේ.

බර්ගොෆ් අත්පොත සකස් කිරීමේ කණ්ඩායම සැකසුණු දා පටන් මේ ව්‍යාපෘතියට විවිධ අවස්ථාවල නන් අයුරින් උදව් කළ සියලු දෙනාට ම අපි ස්තුතිවන්ත වන්නෙමු. අපගේ සම කතෘ ඇලෙක්සැන්ඩර් ඔස්ටින්, ක්ලෝස්-ඩියටර් වයිල්ඩ්, රේනර් ස්ටෙයින්වෙග්, ඔලිවර් විල්ස්, ක්ලෙම් මැක්කාර්ට්නි, හිලරි ක්‍රෝව්, කොන්ස්ටාන්සෙ හෙල්ම්ෂෙන්, එරික් මැන්ටන්, ඇස්ට්‍රිඩ් ෆිෂර් සහ උල්රයික් හෙස යන අය මෙහිදී ප්‍රධාන වෙති.

**මාර්ටිනා ෆිෂර් සහ නෝර්බට් රෝපස්**

බර්ලින් /කොළඹ, ජුලි 20, 2003



© 2006 Berghof Research Center for Constructive Conflict Management